www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ සිසුන් විශ්වවිද්‍යාලවලට බඳවාගැනීමේ ඌනතාවයට මුහුන දෙයි

**Sri Lankan students face lack of university places**

**කපිල ප්‍රනාන්දු විසිනි**

**2009 දෙසැම්බර් 23**

**මේ** වසරේ ශ්‍රී ලංකාවේ උසස් පෙල (උ.පෙ) විභාගයට පෙනී සිට ඉන් සමත් වූ විශාල බහුතරයක් ශිෂ්‍යයන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වනු ඇත. විභාගයට පෙනී සිටි 199,000 ශිෂ්‍යයන් අතරින් 126,000 විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ නමුත් එම අවස්ථාව හිමි වනු ඇත්තේ 20,000 ට ආසන්න සංඛ්‍යාවකට පමනි. අවස්ථාව අහිමි වූවන්ගෙන් සුලු පිරිසකට මුදල් ගෙවා පෞද්ගලික ආයතනයන්ට ඇතුලුවිය හැකි වුව ද බොහෝ දෙනෙක් විරැකියා පෝලිමට එක්වනු ඇත.

ආන්ඩුවේ ශ්‍රම බලකා සමීක්ෂනයට අනුව 2008 වසරේ මැද භාගයේ සිට 2009 වසරේ මැද භාගය දක්වා විරැකියා අනුපාතය 5.5% සිට 6.2% දක්වා වැඩි වී ඇත. 2009 වසරේ දී උසස් පෙල සමත් හා ඉන් ඉහලට අධ්‍යාපනය හැදෑරූ අයගේ විරැකියා ප්‍රතිශතය 27.8%ක් වේ. එම මට්ටමේ ස්ත්‍රී රැකියා විරහිත භාවය 42%ක් වේ. තරුන පරපුරේ උසස් පෙල සුදුසුකම් සහිතව විරැකියාවෙන් පෙලෙන්නන්ගේ ප්‍රතිශතය 1998 සිට 2008 දක්වා වූ දශකය තුල 8.8% සිට 31.9% දක්වා වැඩි වී ඇත.

1997 දී 15.5% සිට 2001 16.3% ක් දක්වා වැඩි වී, 2005 දී 13% ක් දක්වා පහත වැටී දැන් 16% කට නැගී තිබෙන සුදුසුකම් ලැබූවන්ගෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය හිමි වූ සංඛ්‍යාවේ ප්‍රමානයෙන්, තෘතීයික අධ්‍යාපනයේ ගමන් මාවත පෙන්නුම් කරයි. විශ්වවිද්‍යාල ප්‍රවේශයේ ද විභාග වල ද පවත්නා අධික තරගකාරී ස්වභාවය හා කඩා වැටුනු නිදහස් අධ්‍යාපනය හේතුකොටගෙන බොහෝමයක් ශිෂ්‍යයන්ට අමතර පන්ති වල සහය පැතීමට බල කෙරී තිබේ. පුද්ගලික ටියුෂන් පන්තිවල අධික ගාස්තු දිනපතා ඉහල යයි. ගම්බද සිසුන්ට දුර බැහැර ගෙවා පංති වලට පැමිනීමේදී පැය ගනන් මහමග ගතකිරීමට සිදුවෙයි.

2005 සිට 2008 දක්වා වූ වසර හතරක කාලය තුල, ආන්ඩුව විසින් ග්‍රාමීය පාසල් 128 වසා දමන ලදී. පසුගිය මැයි මාසයේ අවසන් වූ, එල්ටීටීඊ ට එරෙහිව ගෙන ගිය යුද්ධයේ වියදම අධ්‍යාපන ප්‍රතිපාදන මෙන් කිහිපගුනයක් විය. මෙම වසරේ ආරක්ෂක වියදම රුපියල් බිලියන 200ක් වන අතර නිදහස් අධ්‍යාපනයේ සමස්ත පිරිවැය බිලියන 47 පමනි.

වර්තමාන ජනාධිපතිවරන ව්‍යාපාරය තුල බලයේ සිටින ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ ප්‍රධාන ප්‍රතිවාදියා වන ජෙනරාල් සරත් ෆොන්සේකා තරුනයින්ගේ ඡන්ද ගරාගැනීම සඳහා සුපුරුදු බොරු පොරොන්දු දෙමින් සිටිති. ජනාධිපතිගේ පුත් නාමල් රාජපක්ෂ "තාරුන්‍යයට හෙටක්" නමින් ව්‍යාපාරයක් දියත් කර ඇති අතර "තාරුන්‍යයේ අපේක්ෂාව කුමක් ද? එය සුබ අනාගතයකි" වැනි හිස් සටන් පාඨ ඉදිරිපත් කරයි.

තරුනයන් මුහුනදෙන ආර්ථික හා සමාජ ප්‍රශ්න වලට රාජපක්ෂ විසින් පැහැදිලි විසඳුම් ඉදිරිපත් කර නොමැති අතර, හුදෙක් එල්ටීටීඊ ය පරාජය කර "මව්බිම බේරා ගත්" බව ප්‍රකාශ කරමින් තරුන ඡන්ද සඳහා ඉල්ලීම් කරයි. සිවිල් ජනතාව, සොල්සාදුවන් හා එල්ටීටීඊ සටන්කරුවන් දහස් ගනනකගේ ජීවිත බිලිගත් වාර්ගික යුද්ධය ජනාධිපති විසින් 2006 ජුලි මාසයේ දී යලි ආරම්භ කලේ ය.

මරන සහ විනාශයන් මෙන්ම, ආන්ඩුවේ අධික යුද වියදම් දරුනු රැකියා කප්පාදුවට සහ අධ්‍යාපනය ද ඇතුලු සමාජ වියදම් කප්පාදුවට සෘජුවම බලපෑවේ ය. තරුන තරුනියන්ට "සුභ අනාගතයක්" නිර්මානය කරනවා වෙනුවට ඩොලර් බිලියන 2.6 ක් වූ ජාත්‍යන්තර මුල්‍ය අරමුදලෙන් ලබා ගත් නයෙහි අවශ්‍යතාවයන් සැපිරීමට මීලඟට පත්වන ආන්ඩුව රාජ්‍ය අංශයේ තවදුර කප්පාදු සඳහා යොමු වනු ඇත.

යුද්ධය ගෙනයෑමේ වගකීම දරන රටේ ප්‍රධාන ජෙනරාල් වූ ෆොන්සේකා, ඊට සමාන ආයාචනයන් ඉදිරිපත් කර ඇත. "තරුනයන්ට සුරක්ෂිතව නිදහසේ ජීවත් විය හැකි පරිසරයක් මම රට තුල ගොඩනගනවා" යයි ඔහු ප්‍රකාශ කලේ ය. 60,000 ක රැකියා විරහිත උපාධිධාරීන් ගැන සඳහන් කල ඔහු, ඔවුනට රැකියා ලබාදෙන බවටත්, උපාධිධාරීන්ගේ පහසුකම් වැඩි දියුනු කරන බවටත් පොරොන්දු දුන්නේය. බලයට පත් වුවහොත්, රාජපක්ෂට මෙන්ම ෆොන්සේකාට ද බලකෙරෙනු ඇත්තේ මහජන වියදම් කප්පාදු කිරීමට ය.

2005 ජනාධිපතිවරන ව්‍යාපාරය අතරතුරදී විශ්විද්‍යාලවලට ඇතුලත් කරගන්නා සංඛ්‍යාව අඩුබව පිලිගනිමින් එම තත්වය වැඩිදියුනු කරන බවට රාජපක්ෂ පොරොන්දු විය. ඇත්තටම නම් ඔහුගේ ආන්ඩුව සිදුකල කල එකම කර්තව්‍යය නම් ධනවතුන්ගේ දූ දරුවන් සඳහා පුද්ගලික වෛද්‍ය විද්‍යාල දෙකක් ස්ථාපිත කිරීමට අවසර ලබා දීමයි.

විශ්වවිද්‍යාල සිසුන්ගේ සහ රැකියා විරහිත උපාධිධාරීන්ගේ විරෝධතාවයන්ට රාජපක්ෂගේ ප්‍රතිචාරය වූයේ ඔවුන් ත්‍රස්තවාදයට උදව් කරන්නන් ලෙස හංවඩු ගසමින් එම විරෝධතාවයන් මැඩපැවැත්වීමට පොලීසිය යෙදවීමයි. රාජපක්ෂ යටතේ හෝ ෆොන්සේකා යටතේ පිහිටුවන ඊලඟ පරිපාලනය තවදුරටත් උසස් අධ්‍යාපනය කප්පාදු කිරීම අතින් වෙනස් නොවනු ඇත. 25 වසරක යුද්ධය අතරතුර ගොඩනගන ලද පොලිස්-රාජ්‍ය සැකැස්ම, විරෝධතා දක්වන ශිෂ්‍යයන් සහ වැඩවර්ජනය කරන කම්කරුවන්ට එරෙහිව මෙහෙයවනු ඇත.

සිසුන් ගනනාවක්ම තමන් මුහුන දෙන තත්වය සම්බන්ධයෙන් සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) වෙත අදහස් දැක්වීය.

ගම්පොල ප්‍රදේශයේ ශිෂ්‍යයෙකු වු අමිල ප්‍රකාශ කලේ තමන් යහපත් ප්‍රතිපල අපේක්ෂාවෙන් උසස් පෙල විභාගයට දෙවරක් පෙනීසිටි නමුත් සරසවි වරම් ලබා ගත නොහැකි වූ බව ය. "දැන් මගේ අනාගතය ගැන හිතා ගන්නා බැරුව අසරන වෙලා ඉන්නේ" යැයි ඔහු පැහැදිලි කලේ ය.

"මම පවුලේ වැඩිමල් දරුවා. මං ගැන මගේ දෙමාපියෝ ගොඩක් බලාපොරොත්තු තියන් හිටියේ. මගේ අම්මා තේ කර්මාන්ත ශාලාවක වැඩ කරන්නේ, තාත්තා කුලී වැඩ කරනවා." යැයි අමිල පැවසූවේය. ඔවුන් දෙදෙනාගේම මාසික ආදායම රු 10,000 ත් 15,000 ත් අතර වන (ඇඩො 87-131) බවත්, ඔහුගේ සහෝදරියන් දෙදෙනා සහ සහෝදරයා ගමේ පාසලට යන බවත් ඔහු පැවසීය. "සමහර දවස්වලට අපිට හරියට කෑමක් නෑ. අපිට හරියට අඳින්න නෑ" යැයි අමිල පැවසුවා.

අමිලගේ පාසැලට කි.මී. 20ක් දුර ගමන් කිරීමට සිදුවිය. ගමටම ඇත්තේ එක් බස් රියක් පමනක් බවත් එය මඟඇරුනොත් වෙනත් බස් රියකට නැගීමට කි.මී. කිහිපයක් පයින් යෑමට සිදුවන බවත් ඔහු පැවසීය. අගෝස්තු විභාගයෙන් පසුව ඔහු තේ කර්මාන්ත ශාලාවක මසකට දින 10 ක් වැඩට යන අතර ඉන් උපයා ගත හැක්කේ රුපියල් 3000 ක් පමනකි.

ප්‍රධාන පක්ෂ, දේශපාලඥයින්, ඔවුන්ගේ පොරොන්දු සහ මැතිවරන පිලිබඳව කිසිදු විශ්වාසයක් නොමැති බව අමිල පැවසුවේ ය. "ඔවුන් අවුරුදු 60 වඩා රට පාලනය කරලා තියනවා. ඔවුන්ට හිතුමතේ පක්ෂ මාරු කරනවා. ඔවුන් හැම වෙලේම අපිව රවටනවා. අපි වගේ දුප්පත් ජනතාවගේ ජීවන තත්වයන් දිගටම කඩාවැටෙනවා." යැයි ඔහු පැවසී ය.

පොලොන්නරුවේ ශිෂ්‍යාවක් මෙසේ කියා සිටියාය. "මෙවර මම විභාගයට පෙනී සිටියේ දෙවන වරටයි. මම විභාගය සමත් නමුත් විශ්වවිද්‍යාලයට යන්න බෑ. ඒක අසාධාරනයි. ගොඩක් දක්ෂ ලමයි ඉන්නවා උසස් අධ්‍යාපන අවස්ථාවන් නොමැතිව."

"මගේ තාත්තා පාරක්‍රම සමුද්‍රයේ ධීවර රස්සාව කරනවා. ඔහුගේ ආදායම ස්ථිර නෑ. මගේ අමතර පන්තිවලට ඔහුට උදව් කරන්න බැරි වුනා. රූපලාවන්‍ය බඩු භාන්ඩ අලෙවි කරලා මගේ වියදම් හොයාගත්තා. මට ආයේ විභාගයට පෙනී සිටින්න බැහැ."

"අපේ පැත්තේ ගොඩක් තරුන පිරිමි ලමයි හමුදාවට බැඳිලා. ගෑනු ලමයි ඇගලුම් කම්හල්වල සහ කුඩා කඩසාප්පු වල රැකියා කරනවා. පොලොන්නරුවේ ලොකුම ඇගලුම්හල බංකොලොත්වෙලා තියෙන්නේ. අපි හිතුවේ යුද්ධයේ අවසානය අපිට හොඳ කාලයක් උදා කරයි කියලා. නමුත් ඒක එහෙම නෑ."

2008 දී විශ්වවිද්‍යාල අවස්ථාව අහිමි වූ තවත් ශිෂ්‍යයෙක් වසරක් පුරා රැකියාවක් ලබා ගැනීමට උත්සහා කලත් තවමත් විරැකියාවෙන් පෙලෙයි. "මුලින්ම මම කටුනායක ගුවන්තොටුපලේ ඉන්ටවිව් එකකට ගියා. ඊලගට කොලඹ වරායට ඊට පසුව වයඹ සරවියේ පරිසනක ආශ්‍රිත රැකියාවකට උත්සහ කලා නමුත් ලැබුනේ නෑ."

මෙම තරුනයා විදේශ රටක රැකියාවක් සොයාගැනීමේ උත්සාහයක නිරතව සිටිය ද එය සාර්ථක වේදැයි ඔහුට විශ්වාසයක් නැත. "මේ ක්‍රමයට තවදුරටත් පැවැත්මක් නෑ. මැතිවරනවලදී පාලක පක්ෂ පොරොන්දු දෙනවා. නමුත් සමාන්‍ය ජනයාගේ යහපත සඳහා මොකුත් කරලා කරලා නෑ."

කලවාන නමැති ගම්බද ප්‍රදේශයේ සමන්ට විශිෂ්ඨ ප්‍රථිපල හිමිව තිබුනි. ඔහු දිලිඳු පවුලකට අයත් වන අතර ස්ථිර ආදායමක් නොමැත. ඔහු බොහෝ දුර කතර ගෙවා ගෙන අමතර පන්තිවලට සහභාගී වුනේ වෛද්‍ය විද්‍යාව හැදෑරීමටයි. ඔහු ඒ සඳහා සුදුසුකම් ලැබූවත් විශ්වවිද්‍යාල අවස්ථාවක් ලබා ගැනීමට නොහැකි විය.

"ජනවාරියේ දී ප්‍රධාන අපේක්ෂකයින්ගෙන් කවුරු දිනුවත් අපිට රැකියාවක් හෝ යහපත් අනාගතයක් ලබා දීමට හැකියාවක් ඇත්තේ නෑ. ඔවුන් හැම මැතිවරනයකදීම පොරොන්දු ගොඩක් දෙනවා. ඔවුන් විපක්ෂයේ ඉන්න කොට පාලක පක්ෂ විවේචනය කරනවා නමුත් බලයට ආවහම ඒකම කරනවා."

© www.wsws.org